හක්මණ ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට හක්මණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂවලට අදාලව කර්මාන්ත 07 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.2,167,531 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි වෙනුවෙන් රු. 65,611 ක් වැඩිපුර ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.133,765 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 39,402,110 ක් වූ ගිණුම් විෂයයන් 19 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, පැවති අසමානතා එකතුව රු. 20,384,788 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.873,211 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට පියවර ගෙන නොතිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 20,811,355 ක් වූ ගිණුම් විෂයයන් 22 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | වසර 07ක පමණ කාලයක සිට නොවෙනස්ව පවතින අගයන් වන අතර උපයෝගී ලේඛන ඉදිරියේදී සොයාගෙන හැකිතාක් දුරට නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී රීති 143 අනුව කටයුතු කරමි. |
| (ii) රීති 213 | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී සභා ලේකම්ගේ අනුමැතිය ලබා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී සභා ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ. 571 | වසර දෙක ඉක්මවූ රු.4,167,341 ක රැඳවුම් තැන්පත් ශේෂ 85 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දැනට සභාවට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් නගර සංවර්ධනයෙහි යෝජිත සාප්පු සංකීර්ණය සකස් කර ආදායම් තත්වය වැඩිකරගෙන මෙම මුදල ගෙවීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 1646 | සභාව සතු වාහන 10 කට අදාල දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු යුතුවේ. | 2020 වර්ෂයේ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 කට අදාළව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,933,283 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,586,757 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ එක් බැංකු ජංගම ගිණුමක වසර ගණනාවකට පෙර අවස්ථා අටකදී තැන්පත් කරන ලද රු.15,910 ක් වූ චෙක්පත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබුණි. | අගරු චෙක්පත්වලට අදාල මුදල් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කරමි. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,614,060 | 1,598,917 | 1,557,045 | 1,375,799 | 1,531,100 | 1,621,679 | 1,386,345 | 1,333,927 |
| කුලී | 8,368,000 | 7,798,518 | 9,044,876 | 747,694 | 7,625,305 | 7,375,441 | 5,875,399 | 1,994,052 |
| බලපත්‍ර ගාස්තු | 411,000 | 492,922 | 469,322 | 39,100 | 459,000 | 669,679 | 665,229 | 15,500 |
| වෙනත් ආදායම් | 11,053,000 | 17,020,957 | 14,354,369 | 14,593,378 | 6,440,000 | 5,712,437 | 7,822,375 | 11,926,790 |
| **එකතුව** | 21,446,060 | 26,911,314 | 25,425,612 | 16,755,971 | 16,055,405 | 15,379,236 | 15,749,348 | 15,270,269 |

**2.3.2 වරිපනම් හා බදු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| ආරම්භක හිඟය රු.1,051,907 ක් වූ අතර, රු.1,089,852 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු. 2,141,759 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.1,305,860 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.835,899 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්,ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 61 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2020 වර්ෂයේ ජනවාරි මාසයේදී අයකල වරිපනම් බදු මුදල් වැඩි ප්‍රමාණයක් වාර්ෂික ගාස්තුව වශයෙන් අයකරගෙන ඇති අතර ඉතිරි වරිපනම් හිඟ මුදල් ඉදිරියේදී අය කරමි. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟය රු.43,490 ක් වූ අතර, බිල් කිරීම් රු.6,060 ක් සමග රු.49,550 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,830 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.44,720 ක් හිඟව පැවතුණි. වර්ෂය තුළ මුළු අයවීම් ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 10 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**2.3.3 කුලී**

------

| | | |
|---|---|---|
| **බිම් බදු** | | |
| ආරම්භක හිඟය රු.238,530 ක් වූ අතර, රු.322,650 ක් වූ බිල්කිරීම් සමග රු.561,180 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.66,000 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.495,180 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 12 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | සමථ මණ්ඩලය වෙත යොමුකර අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.4 ජල ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.831,425 ක් වූ අතර වර්ෂයේ රු.200,681 ක බිල්කිරීම් සමඟ වර්ෂය තුළ රු.1,032,106 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.127,195 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.904,911 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.1,277,911 ක් හා මුද්දර ගාස්තු රු.12,410,556 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාදෙන ලෙස පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලීම් කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක 1597/8 හා 2019 අප්‍රේල් 17 දිනැති ගැසට් පත්‍රයේ 9 වන වගන්තිය ප්‍රකාරව නිසි සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සිදුකල ඉදිකිරීම් 06 කට අදාලව ගාස්තු අයකර විධිමත් කිරීම් කර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නඩු පැවරීමට උපදෙස් ඉල්ලීම් කර ඇති අතර මින් ඉදිරියට එවැනි අඩුපාඩු නොවීමට වගබලා ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/5/6පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව කඩ කාමර 161 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර 11 වන වගන්තියට අනුකූල නොවන පරිදි කඩ කාමර 05 ක් අතුරු බදු දී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය තුලදී නිවැරදි කරමි. |
| (ඇ) | බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිලි ආධාර ලබාදීමට සහා අරමුදලින් රු.850000 ක් වෙන්කර, රු. 500,000 ක මුදලක් ප්‍රතිලාභීන් හට ලබාදී තිබුණි. මේ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර නොතිබූ අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පදනම පැහැදිලි නොවීය. 2020 පෙබරවාරි 25 හා 26 දිනයන්හිදී සිදුකරන ලද නියැදි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අඩු ආදායම්ලාභීන් නොවන ප්‍රතිලාභීන් හත් දෙනෙකුට ද ආධාර ලබාදී තිබුණි. | අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකළ යුතුවේ. | ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කරන බව හා නිවැරදි ක්‍රමවේද අනුගමනය කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 18 ක් සම්පූර්ණ කර ගැනීමට හා 02 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුමත කිරීමට දෙපාර්තමේන්තුව ට යවා ඇත. |
| (ආ) | **සේවක ණය**<br>සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 04 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.25,750 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ණය මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 2103 හා 2018 දෙසැම්බර් 14 දිනැති ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2020 පෙබරවාරි 27 දින සිදු කරන ලද නියැදි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී හක්මන බෙලිඅත්ත මාර්ගයේ සහ හක්මන වලස්මුල්ල මාර්ගයේ සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 181 ක් වෙනුවෙන් රු. 624,570 ක ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමණාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් පරිහරණය කරනු ලබන අක්කර 10 රූඩ් 02 පර්චස් 13.35 ක් වූ ඉඩම් 11 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

**3.4.2 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු රු. 115,000 ක් වටිනා කැබලියපොළ සම්පත් මධ්‍යස්ථානය සහ බැලුම්ගල ප්‍රජා ශාලාව අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි. | නවීකරණයකර නිශ්ක්‍රීයව පවතින වත්කම් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගතයුතුවේ. | අඩුපාඩු සකස් කර ගැනීම සඳහා සභාවේ මුදල් නොමැති බැවින් ඉදිරියේදී ප්‍රතිපාදන ලබාගෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් ඇතිකිරීමට කටයුතු කරන |

| | | | |
|---|---|---|---|
| | | | අතර බැලුම්ගල ප්‍රජා ශාලාවෙහි අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | සභාව සතුව පැවති රු. 130,862 ක් වටිනා කුට්ටිගල් මැෂිම ප්‍රයෝජනයට නොගෙන 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීයව පවතින යන්ත්‍ර ඵලදායී කාර්යයන් සඳහා යොදා ගතයුතුවේ. | වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතුව පැවැති රු.1,320,000 ක් වටිනා වාහන 06 ක් නිෂ්ක්‍රීයව පැවති අතර අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණ කටයුතු සිදු කළ යුතුවේ. | ඉදිරියේදී එම පවරා ගැනීම සිදු කළ වහාම මෙම වාහන 06ම අපහරනය කිරිමට හෝ අළුත්වැඩියා කිරිමට කටයුතු කරමි. |